**ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව - 2015**

**-------------------------------------------------**

ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාවේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2016 අංක 11 දරන ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව පනතේ 19 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමණාකරණයේ වගකීම

**-------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමණාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**-----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වන වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මතය**

මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01 ප්‍රකාරව අයභාර හා වියදම් අයිතම ප්‍රමාණාත්මක වනවිට ඒවායේ ස්වභාවය සහ ප්‍රමාණය වෙන වෙනම හෙළිදරව් කළ යුතු වුවද, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ දක්වා ඇති වෙනත් ලැබීම්, සේවක පාරිශ්‍රමික, පාරිභෝජන හා සැපයුම් හා වෙනත් වියදම් අයිතමයන් සඳහා එසේ හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

**2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

ආයතනය වෙනුවෙන් ප්‍රසම්පාදන කමිටුවක් පත්කර තිබියදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.5.1(ඊ) වගන්තියට පටහැනි ලෙස වටිනාකම රු.1,927,557 ක් වූ යන්ත්‍රයක් මිලදී ගැනීමේදී තාක්ෂණික ඇගැයීම් කමිටුව විසින් ලංසු විවෘත කිරීමේ සිට යන්ත්‍රය මිලදී ගැනීම දක්වා සියළු තීරණ ගැනීම් සිදුකර තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ මූල්‍ය ප්‍රතිඵලය රු.1,224,913 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.655,050 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.569,863 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ සැපයුම් හා පාරිභෝගික සේවා වියදම්, සේවක පාරිශ්‍රමික සහ ස්ථාවර වත්කම් සඳහා ක්ෂය වීම් රු.12,707,760 කින් වැඩිවීම හා පර්යේෂණ සහ සංවර්ධන ආදායම් රු.4,895,789 කින් අඩුවීම සිදු වුවද, පුනරාවර්තන වියදම් සඳහා රජයේ දායකත්වය සහ අනෙකුත් ආදායම් රු.2,557,658 කින් වැඩිවීම හා පර්යේෂණ සහ සංවර්ධන වියදම් සහ වෙනත් වියදම් රු. 15,616,850කින් අඩුවීම අතිරික්තය වැඩිවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සභාවේ මූල්‍ය ප්‍රතිඵලයේ 2011 සහ 2013 වර්ෂවලදී ඌනතාවයක් දක්නට ලැබුණද සේවක පාරිශ්‍රමික සහ ජංගම නොවන වත්කම් වෙනුවෙන් වූ ක්ෂය සැලකීමේදී එහි දායකත්වය 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා අඛණ්ඩ වර්ධනයක් නිරීක්ෂණ වූ අතර සමාලෝචිත වර්ෂයේදී එය රු.46,614,567 ක් විය.

**4. මෙහෙයුම් සමාලෝචනය**

---

**4.1 කාර්යසාධනය**

---

2016 අංක 11 දරන ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව පනතේ 03 වගන්තිය ප්‍රකාරව සභාවේ අරමුණු ලෙස,

* රට තුළ උද්දීපිත විද්‍යා සහ තාක්ෂණික ප්‍රජාවක් ගොඩනැගීම සඳහා විද්‍යාවට සහ තාක්ෂණයට අදාළ පර්යේෂණ පහසු කිරීම සඳහා ආණ්ඩුවට සහාය වීම.

* ජාතික අවශ්‍යතාවලට දායක වන පර්යේෂණ පදනමක් සංවර්ධනය කිරීමට හැකි වන පරිදි උසස් අධ්‍යාපන ආයතනවල, රාජ්‍ය අංශයේ පර්යේෂණ ආයතනවල සහ වෙනත් රාජ්‍ය ආයතනවල විද්‍යාව සහ තාක්ෂණයට අදාළ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සහ ඊට පහසුකම් සැලසීම සහ.

* විද්‍යාව සහ තාක්ෂණයට අදාළ පර්යේෂණ වැඩි දියුණු කිරීම සඳහා පෞද්ගලික අංශයේ සහයෝග ඉල්ලා සිටීම දක්වා තිබුණි.

ඉහත අරමුණු ඉටුකරගැනීම සම්බන්ධයෙන් සිදුකරන ලද පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2005 සිට 2011 වර්ෂය දක්වා පර්යේෂණ ව්‍යාපෘති 148ක් සඳහා එකතුව රු.507,944,787ක ප්‍රදාන ලබාදී තිබූ අතර නිමකර තිබූ ව්‍යාපෘති 90 අතුරින් වටිනාකම රු.79,354,079 ක් වන ව්‍යාපෘති 25 ක් නිමකළ යුතු කාලය ඉක්මවා වසර 01 සිට වසර 02 දක්වා කාලපරාසයක් ගතවී තිබුණි. තවද වටිනාකම රු. 78,819,118 ක් වූ ව්‍යාපෘති 34 ක් සඳහා කිසිදු දේශීය හෝ විදේශීය ප්‍රකාශනයක් සිදුකර නොතිබුණි.

(ආ) වටිනාකම රු. 71,234,289 ක් වූ ව්‍යාපෘති 09 ක් සඳහා සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විට අවසාන වාර්තා ලැබී මාස 04 සිට මාස 11 ක කාල පරාසයක් ගත වී තිබුණද එම වාර්තා ඇගයීමට ලක්කර නොතිබූ අතර වටිනාකම රු. 164,558,285 ක් වූ ව්‍යාපෘති 49 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කර නොතිබුණි.

(ඇ) පර්යේෂණ ව්‍යාපෘති ගිවිසුම ප්‍රකාරව උපකරණ සඳහා මුදල් ප්‍රතිපාදන නිදහස් කිරීමෙන් මාස 06ක් ඇතුළත මිලදී ගැනීම් සිදුකළ යුතු වුවත්, 2013 වර්ෂයේදී පර්යේෂණ ව්‍යාපෘති 08ක් සඳහා ප්‍රදානය කරන ලද රු.13,551,179 කට අදාළ උපකරණ මිලදී ගැනීමේදී වසර 01 සිට වසර 02ක් දක්වා කාලපරාසයක් ගතවී තිබුණි. තවද පර්යේෂණ ව්‍යාපෘතියක් වෙනුවෙන් අවශ්‍ය උපකරණ මිලදී ගෙන නොතිබීම හේතුවෙන් 2014 වර්ෂයේදී බැංකු ජංගම ගිණුමට බැර කර තිබූ මුදලින් රු. 3,481,048 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් නිශ්කාර්යව පැවති අතර 2011 හා 2013 වර්ෂයන්ට අදාළව අත්හැර දමා තිබූ ව්‍යාපෘති 03කට අදාළ එකතුව රු.7,929,184 ක් වසරක කාලයක් ජංගම ගිණුම්වල රඳවා ගැනීමෙන් අනතුරුව නැවත සභාව වෙත පවරාගෙන තිබුණි. මෙලෙස මිලදී ගැනීම් ප්‍රමාද වීම මත ඇතැම් ව්‍යාපෘතීන් අත්හැර දැමීමට සිදුවී තිබූ අතර ආරම්භ කල ව්‍යාපෘති අවසන් කිරීමට නියමිත වර්ෂ 03ක කාලය ඇතුළත අවසන් කිරීමට නොහැකි වී තිබුණි.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ව්‍යාපෘති කළමනාකරණයේ දුර්වලතා

(i) පර්යේෂණ සභාව විසින් ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන ලබාදීමේදී කාර්යසාධනය සලකා බලා වරින්වර මුදල් ලබාදීම වෙනුවට පර්යේෂණය ආරම්භකරන අවස්ථාවේදීම අවුරුදු 03ක කාලපරිච්ඡේදයකට අදාළ සම්පූර්ණ ප්‍රතිපාදනයම ඒ ඒ ව්‍යාපෘති යටතේ වූ ජංගම ගිණුම්වලට බැර කර තිබුණි. ඒ අනුව මූලා අවශ්‍යතාවය නිශ්චිතව හඳුනා නොගෙන එකවර මුදල් ලබාදීම හේතුවෙන් 2011 සිට 2015 දක්වා කාල පරිච්ඡේදය තුළදී තනි පුද්ගල පර්යේෂණ ව්‍යාපෘති 244ක් වෙනුවෙන් ප්‍රදානය කර තිබූ රු.812,304,931ක් අතුරින් ව්‍යාපෘති 167 කට අදාල එකතුව රු.319,814,308 ක් සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් ජංගම ගිණුම් තුළ නිෂ්කාර්යව පැවතුණි.

(ii) පර්යේෂණ ව්‍යාපෘති සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදනවලින් මිලදීගෙන තිබූ වත්කම්, ව්‍යාපෘතිය අවසන් වීමෙන් පසු අදාළ පර්යේෂණ ආයතනයට පැවරීම හෝ වෙනත් පර්යේෂණ ව්‍යාපෘතියකට මාරු කිරීම කළයුතු වුවත්, ව්‍යාපෘති අවසන් වී මාස 03ක සිට අවුරුදු 02ක් ගතවී තිබුණු ව්‍යාපෘති 35 කට අදාළව අවසාන වාර්තා ලබා නොදීම හා ඇගයීම් නොකිරීම යනාදී කරුණු හේතුවෙන් රු. 64,982,879 ක් වටිනා වත්කම් පවරා දීමට හෝ වෙනත් පර්යේෂණ ව්‍යාපෘතිවලට යෙදවීමට කටයුතුකර නොතිබුණි.

(ආ) 2012 හා 2013 වර්ෂයන්හිදි ප්‍රදානය කරන ලද පර්යේෂණ ව්‍යාපෘති 75ක් සඳහා මාස 03ක සිට අවුරුදු 02ක් දක්වා කාලය දීර්ඝ කර ගෙන තිබුණු නමුත් කාල දීර්ඝ කර ගැනීම් පිළිබඳව කොන්දේසි පර්යේෂණ ව්‍යාපෘති ගිවිසුම්වලට ඇතුලත් කර නොතිබුණි.

## 4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

අවශ්‍යතාව නිසි ලෙස අධ්‍යයනය කිරීමකින් තොරව අත්තිකාරම් ලබාදීම හේතුවෙන් අවස්ථා 16කදී ලබා දී තිබූ අත්තිකාරම්වලින් සියයට 20 සිට සියයට 100 දක්වා ඉතිරිවීම් එකතුව රු.390,679 ක් නැවත පියවීමට කටයුතු කර තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 ක්‍රියාකාරී සැලැස්ම

පර්යේෂණ සභාව විසින් ප්‍රධාන වශයෙන් තනි පුද්ගල පර්යේෂණ ව්‍යාපෘති, අරමුණුගත බහු විෂයික පර්යේෂණ ව්‍යාපෘති සහ පෞද්ගලික රාජ්‍ය හවුල්කාරීත්ව පර්යේෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කළද සමාලෝචිත වර්ෂය සඳහා සකස්කරන ලද ක්‍රියාකාරී සැලැස්මේ එක් එක් කාණ්ඩය සඳහා වෙන්කළ ප්‍රතිපාදන වෙන් වෙන් වශයෙන් දක්වා නොතිබුණි.

## 5.2 අභ්‍යන්තර විගණනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණු අතර, අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකයෙන්ද විගණනයක් සිදුකර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේ දී නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. ඉන්වෙන්ට්‍රි ලේඛන හා තොග ලේඛන යාවත්කාලීන කිරීම හා වාර්ෂික තොග සමීක්ෂණ පැවැත්වීම කෙරෙහි විශේෂ අවධානය යොමු කල යුතුය.